**<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>**

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

**<u>පැමිණිලිකරු.</u>**

| | | |
|---|---|---|
| **නඩු අංකය** | **: 3155/විශේෂ** | **එදිරිව** |
| **ස්වභාවය** | **: විශේෂ** | |
| **වටිනාකම** | **: රු.100,000/-** | |
| **කාර්ය පටිපාටිය** | **: සාමාන්‍ය** | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ෆ්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ෆ්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කෂුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, චොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොපි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

සිවිල් නඩු විධාන සංග්‍රහයේ (95 වැනි වගන්තිය සමඟ කියැවෙන) 94 වැනි වගන්තිය යටතේ, ඉහත නම් සඳහන් 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම සඳහා, "X", "Y" සහ "Z" වශයෙන් සලකුණු කොට යා කර ඇති, ආකෘතිවල ගෙනහැර දක්වා ඇති විචාරණ, එය භාරකරවීමේ දින සිට දින 10 ක් ඇතුළත එකී 1 වැනි, 2 වැනි, 3 වැනි සහ 4 වැනි විත්තිකරුවන් විසින් පිළිතුරු දිය යුතු බවට අණ කරමින්, ඔවුන් වෙත ඔවුන්ගේ ඒ ඒ නීතිඥවරුන් මඟින් භාරකරවීමට ගරු අධිකරණයේ අවසරය අයැද සිටිමු.

එම විචාරණ ආපසු කැඳවීම සඳහා ඉක්මන් දිනයක් නියම කරන ලෙස ඉල්ලා සිටිමු.

පැමිණිලිකරුගේ නීතිඥ මහතාට මෙම ඉල්ලීම තහවුරු කිරීමට හැකිවන සේ මෙම නඩුව 1992 මාර්තු මස 09 වැනි දින විවෘත අධිකරණයේ කැඳවන මෙන් ද වැඩිදුරටත් ගෞරව පූර්වකව ඉල්ලා සිටමු.

1992 මාර්තු මස 06 වැනි දින දී ය.

පැමිණිලිකරුගේ නීතිඥ.